**රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල - 2020**

-----------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

--------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

--------------------------------------------------------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධව විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුලත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-------------------------------------------------------------

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01- ප්‍රමිතිය ප්‍රකාරව අස්ථිත්වයක වත්කම් එම අස්ථිත්වය විසින් පාලනය කළ යුතු අතර අස්ථිත්වයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා එම වත්කම් ප්‍රයෝජනවත් විය යුතුය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල ධාරණ වටිනාකම රු.49,509,055 ක් ලෙස වාර්තා කර තිබුණද, එම වත්කම් අරමුදලේ අරමුණු ඉටු කර ගැනීම සඳහා භාවිතා නොකොට ශ්‍රී | මෙම අරමුලට අදාල කළමනාකරණ විධිවිධාන ඇතුලත් රේගු ආඥා පනතේ 153 (අ) (1) හි සඳහන් පරිදි රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල පිහිටුවීමේ එක් අරමුණක් වන්නේ රේගු කළමනාකරණයෙහි සඵලතාව වර්ධනය කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනීයන පහසුකම් සැලසීම සඳහා වියදම් දැරීමයි.ඒ අනුව මෙම අරමුදලේ මුදල් වියදම් කොට භාවිතයට ගන්නා ජංගම නොවන වත්කම් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සඵලතාව වැඩි දියුණු කිරීම සඳහා භාවිතා කරන බැවින් | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවට වාර්තා කර ඇති හෙයින් මෙම අරමුදල වෙනම අස්ථිත්වයකි. එම නිසා අරමුදලේ ප්‍රයෝජනය සඳහා යොදාගන්නා වත්කම් පමණක් එම අරමුදල යටතේ ගිණුම්ගත කල යුතු වීම. |

| | |
|---|---|
| ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් එහි මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන බව නිරීක්ෂණය විය. මෙම වත්කම්වලට අදාලව සමාලෝචිත වර්ෂයේ ක්ෂය ප්‍රමාණය ලෙස රු.6,03,725 ක වියදමක් ද ගිණුම්ගත කර තිබුණි. | ගිණුම්ගත කරන ලද වියදම් එයට අනුකූල වේ.<br>ව්‍යවස්ථාපිත අරමුදල් ,භාර අරමුදල් සහ දෙපාර්තමේන්තු අරමුදල් කළමනාකරණය පිළිබඳ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2006.12.22.දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/423 හි 4.2 ඡේදයට අවධානය යොමු කරමි.එකී ඡේදයේ (ආ) අනු ඡේදය අනුව අරමුදලේ ලැබීම් සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන නොයන්නේ නම් එම මුදල් එම දෙපාර්තමේන්තුවේ නිල බැංකු ගිණුමේ තැන්පත් කොට මාසික ගිණුම් සාරාංශ මගින් භාණ්ඩාගාරය වෙත වාර්තා කල යුතු බව දක්වා ඇත. තවද අරමුදලේ ගණුදෙනු දෙපාර්තමේන්තුවේ අනෙකුත් ගණුදෙනු සමඟ මාසිකව ගිණුම් සාරාංශ මගින් සිදු කරනු ලබන්නේ නම් අරමුදලේ ගිණුම් භාණ්ඩාගාර ගිණුම් සමඟ මාසිකව සැසඳිය යුතු බව දක්වා ඇත. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානය වන විට විමර්ශන කටයුතු අවසන්ව තිබූ රේගු වැරදි 127 කින් ලිපිගොනු 98 කට අදාලව ලැබී තිබූ රු.729,265,411 ක දණ්ඩන මුදලින් රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුලට සිදු කල යුතු සියයට 20 ක දායකත්වය හෙවත් රු.145,853,082.20 ක මුදල නිසි පරිදි ගෙවා නොතිබීම හේතුවෙන් අරමුදලේ ආදායම ලෙස ගිණුම් ගත වී නොතිබුණි. | දැනට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය අනුව විමර්ෂන කටයුතු අවසන් වුවද ත්‍යාග ගොණු සඳහා ගෙවීම් කරන අවස්ථාව වන තෙක් රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලට 20% දායකත්වය බැර නොවේ. විශේෂයෙන්ම මෙම ත්‍යාග ගොණුවලට අදාල ලැබීම් පෙර වර්ෂයේ හෝ වර්ෂ කිහිපයකට පෙර ලද ලැබීම් වන අතර ගෙවීම් කරන අවස්ථාවේ පවත්නා අරමුදල් ශේෂයන් සැලකිල්ලට ගෙන ගෙවීම් කරනු ලබන හෙයින් ගොණුවක් සම්පූර්ණ වූ වහාම ගෙවීම් නොකෙරේ. තවද මෙම රේගු විමර්ෂනයන් සඳහා යම් වියදමක් දරා තිබුන හොත් එම මුදල් අඩුකර ඉතිරිය පමණක් බෙදාගැනීම සිදු කරයි.එසේම විශේෂ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන ඔත්තුකරුවන්ගේ ගෙවීම් හා ප්‍රමුඛතා මත අත්තිකාරම් ගෙවන අවස්ථාවේදී එම මුදලට අදාල 20% දායකත්වය මෙම අරමුදලට බැර කිරීමක් සිදු නොවන අතර එම ගොණු සඳහා සම්පූර්ණ ගෙවීම් සිදුකරන අවස්තාවේ මෙම අරමුලට අදාල ශේෂය මාරු කිරීම සිදු කෙරේ.ඉහත කරුණු හේතුවෙන් එකතුවන දණ්ඩන මුදලින් සියයට 20 ක සම්පූර්ණ දායකත්වයම මෙම ගිණුමට මාරු නොකෙරේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන්නේ නම් උපචිත පදනම මත ගිණුම් සැකසිය යුතුවීම. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට භාණ්ඩාගාර පොත් අනුව අරමුදලේ සමුච්චිත ශේෂය හා දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය අතර රු.21,998,802 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස්කම් සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. | අරමුදලේ සම්මුච්චිත ශේෂය දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර ශේෂය අතර වෙනස පෙර වර්ෂ ගණනාවක සිට පැවත එන ශේෂයකි.මේ සම්බන්ධව පරික්ෂා කොට අවශ්‍ය ගැලපීම් කිරීමට ඉදිරියේදි කටයුතු කිරිමට සටහන් කොට ගෙන ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දත්තයන් අතර යම් වෙනස්කම-ක් වූයේ නම් එම වෙනස්කම් සසඳා මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කල යුතු වීම. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිඟ දණ්ඩන ආදායමට අදාල ලිපිගොනු 127 ක ප්‍රමාණයෙන් ලිපිගොනුවක් රේගු පරිශ්‍රය තුළ අස්ථානගත වීම. | කළමණාකාරීත්වය විසින් පිළිතුරු ලබා දී නොතිබුණි. | රේගු පරිශ්‍රය තුළ ලිපිගොනු අස්ථාගත නොවීම සඳහා අවශ්‍ය පාලන ක්‍රමවේදය සකස් කළ යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 445,228,992 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 517,183,257 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.71,954,265 කින් අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට දණ්ඩන ආදායම රු.171,203,443 කින් අඩුවීම හා විවිධ වියදම් රු. 23,432,544 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවීම හිඟහිටව පැවතුණ රු.2,059,507,428 ක් දණ්ඩන ආදායම තුල වූ රු.1,031,961,201 ක මුදලක් 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා සමුච්චිත වෙමින් පවතින වටිනාකමක් බව නිරික්ෂණය විය. | හිඟ දණ්ඩන ආදායම් රැස්කිරීම් පිළිබඳව ගැටළු පවතින බව අවධානයට යොමු වී ඇති බැවින්, දණ්ඩන ආදායම රැස්කිරීමේ ක්‍රියාවලිය නැවත සමාලෝචනය කර, හිඟ දණ්ඩන ආදායම රැස් කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හත් දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇත. එමගින් ඉදිරියේදී හිඟ | හිඟ දණ්ඩන ආදායම රැස් කිරීම සඳහා විධිමත් පාලන ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | | දණ්ඩන ආදායම් රැස් කිරීමේ ගැටළුවලට විසඳුම් ලබාගැනීමට කටයුතු කරමි. | |
| (ආ) | ඉහත සඳහන් හිඟ මුදල තුළ වූ එක් අවස්ථාවකට අදාල රු. 10,000,000 ක දණ්ඩන මුදලක් සඳහා 2009 වර්ෂයේ සිට මුදල් අමාත්‍යවරයා වෙත අභියාචනා ඉදිරිපත් කර ඇති බවට වාර්තා වී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් අයවී තිබුණේ රු.600,000 ක් පමණක් බව නිරීක්ෂණය විය. | - එම - | - එම - |
| (ඇ) | ඉහත සඳහන් හිඟ මුදල තුළ වූ අවස්ථා 38 කට අදාල රු. 498,524,278 ක දණ්ඩන මුදලක් සඳහා 2018 වර්ෂයේ සිට මුදල් අයකර ගැනීම සඳහා සිහිකැඳවීම් යොමුකර තිබූ බවට වාර්තා වී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් අයව තිබුනේ රු.92,061,351 ක් පමණක් බව නිරීක්ෂණය විය. | - එම - | - එම - |
| (ඈ) | ඉහත සඳහන් හිඟ මුදල තුළ වූ එක් අවස්ථාවකට අදාලව රු. 20,000,000 ක දණ්ඩන මුදලක් සඳහා 2008 වර්ෂයේ සිට ජනාධිපති ලේකම් කාර්යාලය වෙත අභියාචනය කර ඇති බවට වාර්තා වී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් අයව තිබුණේ රු.500,000 ක් පමණක් බව නිරීක්ෂණය විය. | - එම - | - එම - |
| (ඉ) | සිහි කැඳවීම් යවා තිබුණ ද ඉහත සඳහන් හිඟ මුදල තුළ වූ 2016 සිට හිඟ හිටව තිබූ අවස්ථා 06 කට අදාලව රු.52,540,000 ක දණ්ඩන මුදලින් කිසිදු මුදලක් අය කර ගෙන නොතිබුණි. | - එම - | - එම - |
| (ඊ) | රේගු ආඥා පනතේ 18 (2) වගන්තිය අනුව දණ්ඩන මුදල් අයකර ගැනීම වර්ෂ 02 ක් ඇතුළත සිදු කළ යුතු වුවද අයකර ගැනීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වීම මත අවස්ථා 05 කට අදාලව රු.38,441,954 ක ආදායමක් රජයට අහිමි වී තිබුණි. | - එම - | රේගු ආඥා පනතට අනුකූලව කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (උ) | රේගු ආඥා පනතේ 153 (අ) (1) වගන්තිය ප්‍රකාරව අරමුදලේ අරමුණුවලට පටහැනි ලෙස රු.10,974,502 ක මුදලක් වැය කර තිබුණි. | රේගු ආඥා පනතේ 153(අ) (i) වගන්තිය අනුව රේගු කළමනාකරණයේ සඵලතාවය වර්ධනයකිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනීයන පහසුකම් සැලසීම සඳහා වියදම් දැරීය හැකිය . වාර්තාවේ දක්වා ඇති ලෝක රේගු දිනය සැමරීම සිදු කරනුයේ ලෝක රේගු සංවිධානය මගින් නිර්දේශ කරන හා හඳුන්වාදෙන නිර්ණායක හා පොදුවේ පිළිගත් ක්‍රමවේදයන්(Best Practices) නිලධාරීන්හට හඳුන්වාදීම පෙරදැරි කරගෙනය.<br>මෙවැනි වියදම් දැරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන් මුදල් ඇමතිතුමාගේ අනුමැතිය ඇතිව රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති 1993.11.05 දිනැති අංක 792 දරණ ගැසට් පත්‍රයේ ද පැහැදිලිව දක්වා ඇත. තවද, හම්බන්තොට වරායේ ගේට්ටු රාජකාරියේ නිරත නිලධාරීන්ට ආහාර පාන ලබාදීම කරනුයේ එම ප්‍රදේශයේ පවත්නා දුෂ්කරතාවයන් සැලකිල්ලට ගැනිමෙන්,සීමිත නිලධාරීන් සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇති නිසාත් සේවා කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට මෙන්ම ඔවුන් අභිප්‍රේරණය කිරීමේ අරමුණිනි. මෙකී වියදම් සියල්ල අරමුදලේ අරමුණු හා එකඟවේ.<br>ස්ථාවර වත්කම් ක්ෂය කිරීම ගිණුම් ගත කිරීම වියදමක් නොවන අතර ගිණුම් ගැලපීමක් පමණි. | රේගු ආඥා පනතට අනුකූලව කටයුතු කළ යුතුවීම. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සඵලතා වර්ධනය කිරීම හා නිලධාරීන්ට වන්දි ගෙවීම සඳහා වූ නිශ්චිත නිර්ණායක හා අනාගත අපේක්ෂිත අරමුණුගත වියදම් නිවැරදිව සැළසුම් නොකිරීම හේතුවෙන් වාර්ෂිකව එකතු වන මුදල් මගින් අරමුදලේ සමුච්චිත ශේෂය වාර්ෂිකව | රේගුආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව රේගු විමර්ශන වල විකුණුම් හා දණ්ඩන මගින් පනවන ලද දඩ මුදලින් අදාල වියදම් ඇතොත් එය අඩු කිරීමෙන් පසු සියයට 20 ක ප්‍රමාණයක් මෙම අරමුදලට බැර කෙරේ.ඒ අනුව සම්මුච්චිත ශේෂයක් | රේගු ආඥා පනත මේ වන විට වසර 151 ක් පමණ පැරණි වන අතර එම කාලය තුළදී තිබූ ආනයන අපනයන තත්ත්වයන් මත එම පනත පිළියෙල කර තිබුණි. එහෙත් එය වර්ථමාන ගතික |

| | | | |
|---|---|---|---|
| | අඛණ්ඩව වර්ධනය වීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය. 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලයන 7,334 ක් වූ අරමුදලේ සමුච්චිත ශේෂය 2020 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 7,779 ක් දක්වා රු.මිලියන 445 කින් හෙවත් සියයට 6 කින් වර්ධනය වී ඇති බවත් නිරීක්ෂණය විය. එනම් සමාලෝචිත වර්ෂයේ ආදායමින් සියයට 90 ක්ම අරමුදල තුල සමුච්චනය වී ඇති බව නිරීක්ෂණය විය. | අරමුලේ ඇති අතර වාර්ෂිකව ප්‍රවර්ථන ශේෂයන් එයට එකතු වේ. ඒ අනුව අරමුදල් අගය වාර්ෂිකව ඉහළ යයි. 2020.12.31 දිනට ගිණුමේ ශේෂය රු.මිලියන 7,729 කි.ඇතිවී තිබෙන පරිගනක හා අනෙකුත් තාක්ෂණ දියුණුව උපයෝගී කර ගෙන ඉතා සැලසුම් සහගත ලෙස කණ්ඩායම් වශයෙන් වංචා හා අක්‍රමිකතා සිදු කිරීම සමස්ථයක් වශයෙන් ලෝකය පුරා වර්ධනය වී ඇති බව නිරීක්ෂණය කෙරේ. ඒ අනුව අප රට තුළද මෙවැනි වංචාකාරී ලෙස මුදල් ඉපයීමේ ප්‍රවනතාවය වැඩි වීමේ තත්ත්වය තුළ රේගු බදු වංචාවන්ගේ අඩුවීමක් අපේක්ෂා කිරීම අපහසු වේ. | තත්ත්වයන් සැලකිල්ලට ගෙන වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කළ යුතු වීම. |
| (ආ) | 2012 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපර්ච්ඡේදය තුළ රු.මිලියන 6,025 ක පමණ මුදලක් බැර කර තිබූ අතර එම කාලය තුළ නිම කර තිබුණු රේගු විමර්ශන සංඛ්‍යා 2,563 ක් විය. 2019 වර්ෂයේදී මෙම අරමුදලට රු.මිලියන 729.36 ක් වෙන් කර තිබුණ ද 2020 වර්ෂයේදී එය රු.මිලියන 495.98 ක් දක්වා සියයට 32 කින් පහළ ගොස් තිබුණි. රේගු බදු වංචාවන් පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් පියවර අනුගමනය නොකිරීම හේතුවෙන් ඇති වන විවිධ රේගු වැරදි සඳහා පනවන දණ්ඩන අරමුදලින් ලැබෙන මුදලින් සියයට 20 ක සමාන ප්‍රතිශතයක් මෙම අරමුදලට බැර වීම හේතුවෙන් මෙම අරමුදල අඛණ්ඩව වර්ධනය වී තිබූ බව නිරීක්ෂණය විය. | -එම- | නිලධාරීන්ගේ සඵලතාවය වර්ධනය කර ගැනීම සඳහා වර්තමාන තත්ත්වයට ගැලපෙන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුවීම. |
| (ඇ) | රේගු වැරදි සඳහා දණ්ඩන පැනවීමේදී අහිමි වූ රජයේ බදු ආදායමද එම දණ්ඩනයේ කොටසක් ලෙස සැලකීමත් එම දණ්ඩනය පදනම් කරගෙන නිලධාරීන්ගේ ත්‍යාග තීරණය කිරීමත් හේතුවෙන් නිලධාරීන්ට ගෙවනු ලබන ත්‍යාග මුදල් ප්‍රමාණයේ ඉහළ යෑමක් මෙන්ම මෙම අරමුදලට වෙන්කරන මුදල් ප්‍රමාණයේ ඉහළ යාමක් සිදු වී තිබුණ ද | රේගු වරදක් දණ්ඩනයක් පැන වීමට හැකියාවක් ලැබෙන්නේ එම වරද අනාවරණය කර ගැනීමට නිලධාරීන් සූක්ෂම වී කටයුතු කරන නිසා ය. එසේ සූක්ෂම වී යම් වරදක් අනාවරණය කර ගත්තේ නැති නම් එම සිද්ධියට අදාල මුළු ආදායම් ප්‍රමාණයම ඇතැම් විට රජයට අහිමි වන මුදලක් බවට පත් වේ. | රේගු වැරදි මුල් අවස්ථාවේදීම අනාවරණය කර ගැනීම රේගු නිලධාරීන්ගේ රාජකාරියක් බව පෙනී යයි. මුල් අවස්ථාවේදී රේගු වැරදි අනාවරණය කර නොගැනීම හේතුවෙන් පසු අවස්ථාවකදී නැවත රේගු |

| | | | |
|---|---|---|---|
| | රජයේ බදු ආදායම නියමිත පරිදි අයවීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය. | නමුත් නිලධාරීන් ගේ දක්ෂතාවය මත එම රේගු වරද අල්ලා ගැනීමට හැකිවීම තුළ එකතු කර ගන්නා මුදලින් සියයට 30 ක ප්‍රමාණයක් රජයට ලැබෙන නිසා රජයේ ආදායමට යම් ප්‍රමාණාත්මක දායකත්වයක් ලැබෙන අතරම, නිලධාරීන් තුළ රේගු වැරදි අල්ලා ගැනීමට ඇති වන පෙළඹවීම ද ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි වේ. | නිලධාරීන් විමර්ශනයක් සිදු කර ලබා ගන්නා දඩ හා රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල් තුළින් සියයට 70 ක්ම ඒකාබද්ධ අරමුදලට නොඒම සම්බන්ධව සමාලෝචනයක් සිදු කර අවශ්‍ය පියවර ගත යුතු වීම. |
| (ඇ) | වර්තමානයේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් ආනයන හා අපනයනයන්වල ඇතිවී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත හා අදාළ අරමුදල්වල නෛතික විධිවිධාන විධිමත්ව හා කාලීනව සංශෝධනය වී නොතිබීම මෙම වර්ධනයන් සඳහා මූලික වශයෙන් බලපා තිබූ බව නිරීක්ෂණය විය. | ගැලපෙන අයුරින් රේගු ආඥා පනත හා අරමුදල්වල නෛතික ප්‍රතිපාදන වරින් වර සංශෝධනය වී ඇති අතර, ඉදිරියේදී අදාල පරිදි සංශෝධනය කිරීම පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ. | රේගු ආඥා පනත මේ වන විට වසර 151 ක් පමණ පැරණි වන අතර එම කාලය තුළදී තිබූ ආනයන අපනයන තත්ත්වයන් මත මෙම පනත පිළියෙල කර තිබුණද එය වර්ථමාන ආනයන අපනයන තත්ත්වයන් සැලකිල්ලට ගෙන වර්තමානයට ගැලපෙන පරිදි පවතින පනත සංශෝධනය කළ යුතු වීම. |
| (ඉ) | අරමුදලේ අතීත ක්‍රියාකාරකම් සමාලෝචනය කර අරමුදල තුළ සමුච්චනය වන ශේෂයන් ඒකාබද්ද අරමුදලට ලබා ගැනීම සඳහා වූ සුදුසු ක්‍රමවේදයක් සැකසීම සඳහා වගකිව යුතු පාර්ශවයන්ගේ අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවයක් නිරීක්ෂණය කරනු ලැබේ. | කළමනාකාරීත්වය විසින් පිළිතුරු ලබාදී නොතිබුණි. | අතිරික්ත මුදල් පිළිබඳව භාණ්ඩාගාරයෙන් විමසා සුදුසු ක්‍රමවේදයක් සැකසීම. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ ආදායම රු.මිලියන 496 ක් විය. සමස්ථ වියදම රු.මිලියන 51 ක් වුවද, අරමුදලේ මූලික අරමුණු වෙනුවෙන් වැය කර ඇති මුදල ආසන්න වශයෙන් රු.මිලියන 40 ක් විය. එය ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 08 ක් වී තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ .<br>මෙම අරමුදලේ මූලික අරමුණු අතර දේශීය හා විදේශීය පුහුණු සඳහා වියදම් දැරීම සිදුවන අතර රටේ පැවති කොරෝනා වසංගතය තත්ත්වය හමුවේ රට වරින් වර වසා දැමීම මත සැලසුම් කළ පරිදි පුහුණුවීම් කටයුතු සඳහා නිලධාරීන් යොමු නොකිරීම නිසා මෙම තත්ත්වය ඇති වී ඇත. | පනත සංශෝධනය කළ යුතුවීම හා රේගු නිලධාරීන්ට වන්දි ගෙවීම හා සේවක සුභසාධනය වර්ධනය කර ගැනීම සඳහා වර්තමාන තත්ත්වයට ගැලපෙන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (උ) | මෙම අරමුදලේ මූලික අරමුණු අතර එක් අරමුණක් ලෙස රේගු නිලධාරීන් සිය රාජකාරීවල නිරත වීමේදී වන ආපදාවන්ට වන්දි ගෙවීම හඳුනාගෙන තිබුණද, ඉකුත් වර්ෂ 07 ක කාලපරිච්ඡේදය තුළ එවැනි කිසිදු වන්දි ගෙවීමක් වාර්තා වී නොතිබුණි. ඒ අනුව එම අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් තවදුරටත් මෙම අරමුදලට අසාමාන්‍ය ලෙස මුදල් රැස් කිරීමක් සිදු වන බව විගණනයේදී නිරීක්ෂණය විය. | ඉහත වර්ෂ 7 තුල එවැනි ආපදාවන් වෙනුවෙන් වන්දි ඉල්ලීම් කිසිවක් ලැබී නොතිබිණි. තවද, රේගු වැරදි අල්ලා ගැනීමට දැඩි කැපවීමකින් කටයුතු කරන අවංක නිලධාරීන්හට ජීවිත තර්ජනද ඇති වී ඇති බැවින්, එම නිලධාරීන්ට ජීවිත අවධානම ද නොතකා රාජකාරි වෙනුවෙන් කැපවීමට මෙවැනි අරමුදලක විශාල මුදලක් පැවතීම රක්ෂණ අරමුදලක් මෙන් ඔවුන්ගේ පවුල්වලට හොඳ සුරක්ෂිතභාවයක් තහවුරු කරයි. එය නිලධාරීන්ගේ රාජකාරි ඉටු කිරීමේදී ජීවිත අවධානම් නොතකා රාජකාරි සඳහා කැප වීමට දිරිගැන්වීමක් සිදු කරයි. | -එම- |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී අරමුදලින් දරන ලද වියදම් පිළිබඳව සත්‍ය සංඛ්‍යා හා අයවැයගත සංඛ්‍යා සමඟ සැසඳීමේදී වියදම් විෂයයන් 06 ක් සඳහා සියයට 100ක් දක්වා වූ ප්‍රමාණාත්මක විචලනයක් නිරීක්ෂණය වීම හේතුවෙන් අයවැය ලේඛණය සඵලදායී කලමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන තිබූ බවක් නිරීක්ෂණය නොවීය. | ඇස්තමේන්තු සැකසීමේදී එම අවස්ථාවෙහි පවතින අවශ්‍යතාවයන් හා අනෙකුත් තොරතුරු පදනම් කොට ඒවා සකස් කළ ද අදාල වියදම් සියයට 100 ක් නිවැරදිව පුරෝකථනය කළ නොහැකිය. 2020 වර්ෂයේ වරින්වර සිදු කළ නිරෝධායන ඇඳිරි නීතිය හා Covid වසංගතය හේතුවෙන් ඇති වූ අනෙකුත් සීමාකාරී සාධක හේතුවෙන් අපේක්ෂා කළ පරිදි නිලධාරීන් පුහුණුවීම් සඳහා යොමු කළ නොහැකි වීම ප්‍රධාන වශයෙන් නිරීක්ෂණයේ දක්වා ඇති වෙනස්කම් සඳහා හේතු වී ඇත. | අයවැය පිළියෙල කිරීමේදී නිසි පරිදි අවශ්‍යතා හඳුනාගෙන අවශ්‍ය ප්‍රතිපාදනයන් සැලසිය යුතුවීම. |